**උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය - (වැඩසටහන් සංරචකය)**
**2024 ජුනි 28**
**-----------------------------------------------------------------------------------------------------------------------**

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියේ (ව්‍යාපෘති සංරචකය) 2024 ජුනි 28 දිනෙන් අවසන් සය මාසික කාලය සඳහා වූ ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජුලි 17 දින එළඹි අංක 8743 එල්කේ දරන ණය ගිවිසුමේ හා අංක 6026 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09 (ආ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය හා මූල්‍ය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර රජයේ විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

ප්‍රමුඛ විෂයයන්ට (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ වෛද්‍ය අංශ) රජයේ විශ්ව විද්‍යාලවලට, ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම වැඩිකිරීම, උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම හා උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නව සොයා ගැනීම් දිරිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ණය සහ මූල්‍ය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,136කට සමාන එජඩෝ මිලියන 100ක මුදල ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි.

ව්‍යාපෘතිය එහි කටයුතු 2018 මාර්තු 01 දින ආරම්භ කරන ලද අතර 2024 ජුනි 28 දින නිම කරන ලදී.

## 1.3 මතය

2024 ජුනි 28 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ මාස හයක කාලය සඳහා මූල්‍ය කාර්යසාධනය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය දරන පාර්ශවයන්ගේ වගකීම

මෙම ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොර වූ ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිත කරණ ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරණ ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් ගණන් බේරා වසා දැමීමේ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය දරන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 15 දින රු.432,400,031ක කොන්ත්‍රාත් වටිනාකමකින් යුත් යාපනය | කරුණ සමග එකඟ වේ. | අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර |

| | | | |
|---|---|---|---|
| | විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ල සහ අදාළ ව්‍යුහය ඉදිකිරීම සඳහා AHEAD ව්‍යාපෘතියෙන් ලැබුණු ආධාර මුදලින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. ගිවිසුම ප්‍රකාරව, ඉදිකිරීම් 2023 ජුනි මස දී අවසන් කළ යුතු අතර එය 2023 දෙසැම්බර් 31 සහ 2024 මාර්තු 31 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, 2024 මාර්තු 31 වන විට ඉදිකිරීම් අවසන් කර නොමැති බවත්, 2024 මාර්තු 31 දිනට වැඩවලින් සියයට 40ක් පමණක් අවසන් කර ඇති බවත් නිරීක්ෂණය විය. | | ගැනීම සඳහා සැලසුම් කර ඇති පරිදි කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | අපේක්ෂකයින් 18 දෙනාගෙන් තිදෙනෙකු තම ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු අවලංගු කර හෝ අත්හිටුවා ඇති අතර ව්‍යාපෘති ප්‍රදානය මගින් රු. 11,537,940ක වියදමක් දරා ඇත. කෙසේ වෙතත්, එම අපේක්ෂකයින්ගෙන් රු.4,739,430 ක මුදලක් අයකර ගැනීමට නැගෙනහිර විශ්වවිද්‍යාලය විසින් අවශ්‍ය පියවර ගෙන නොමැත. | අධ්‍යයන ආයතන අංශය විසින් ප්‍රදානය අයකර ගැනීමට පියවර ගනු ලැබේ. | උපාධි අත්හිටුවන ලද අපේක්ෂකයින්ගෙන් ප්‍රදාන මුදල අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ව්‍යාධි විද්‍යා අංශය සඳහා සැලසුම් කර තිබූ මහල් 04 කින් යුත් ගොඩනැගිල්ලේ මහල් 02ක් පමණක් ඉදිකර තිබුණද, ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයට භාර දී තිබුණි. රු.4,582,160 ක වියදමින් එම මහල් 02 හි කටයුතු සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ජෛව අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නල පද්ධතියක් සහ රසායනාගාරයක් සඳහා ගලියක්, ගිනි නිවන උපකරණ, නැවුම් වාතාශ්‍ර සැපයුම වැනි එම මහල් තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි විය. | අරමුදල් වෙන් කර නොමැතිකම හේතුවෙන් මහල් ගණන අඩු කිරීමට තීරණය කරන ලදී. පවතින අරමුදල් භාවිත කර මහල් 3ක් සම්පූර්ණ කර ඇති අතර මහල් එකී මහල් තුනම සිසුන්ගේ ඉගැන්වීමේ කටයුතු සහ පශ්චාත් උපාධි ඉගැන්වීමේ කටයුතු සඳහා යොදා ගනී.<br><br>ශිෂ්‍ය ප්‍රදේශයක් වශයෙන් නම් කර ඇති බිම් මහල ඉදි කරමින් පවතින අතර එම ගොඩනැගිල්ලට යාබදව පිහිටි ජාතික ප්‍රතිශක්තිකරණ ගොඩනැගිල්ල ඉදිකරමින් පවතින බැවින් දැනට භාවිත නොකෙරේ. ඉදිකිරීම් කටයුතු නිමවන තෙක් එම ප්‍රදේශය ආරක්ෂිත නොවන අතර භාවිතයට සුදුසු නොවේ. | අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් කර ඇති පරිදි කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය |

## 2.2 ඌන උපයෝජිත සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | රු. 8,582,703ක පිරිවැයක් දරා සබරගමුව විශ්වවිද්‍යාලයේ හරිතාගාර දෙකක් 2023 සැප්තැම්බර් මාසයේදී නිම කර තිබුණද, වගා හා පර්යේෂණ කටයුතු සඳහා භාවිත නොකර වසරක් පුරා නිෂ්ක්‍රීයව පැවතුනි. | ස්ථිරව ජල හා විදුලි සම්බන්ධතා පීඨ සංකීර්ණයෙන් ලබා ගන්නා තෙක් තවකාලික පහසුකම් සපයාගෙන වගා කටයුතු ඉක්මණින්ම ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව සතුටින් දන්වා සිටින්නෙමු. | හරිතාගාර ඵලදායී ලෙස භාවිත කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය, තාක්ෂණ පීඨය සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨ වෙත AHEAD ව්‍යාපෘතිය මගින් ලබා දුන් රු. 8,013,485ක් වටිනා රසායනාගාර උපකරණ 2024 දෙසැම්බර් 31 වන විට නිෂ්ක්‍රියව පැවති අතර රු.6,168,402 ක් වටිනාකමකින් යුත් රසායනාගාර උපකරණවල වගකීම් කාලය 2024 ජුනි වන විට කල් ඉකුත් වී තිබුණි. | RT-PCR යන්ත්‍රය - රසායනාගාරයේ වැඩ අවසන් කර නොමැති හෙයින් පරීක්ෂණ කටයුතු සඳහා එය භාවිතා කිරීමට නොහැකි වී තිබේ. | රසායනාගාර උපකරණ ඵලදායී ලෙස භාවිත කිරීමට කටයුතු කළ යුතුය. |